**දැනුම් කේන්ද්‍රයෙහි පදනම ලෙස පාසැල් අධ්‍යාපන පද්ධතිය ප්‍රතිනිර්මාණය කිරීමේ ව්‍යාපෘතිය - මධ්‍යම මට්ටම - 2015**

---

දැනුම් කේන්ද්‍රයෙහි පදනම ලෙස පාසැල් අධ්‍යාපන පද්ධතිය ප්‍රතිනිර්මාණය කිරීමේ ව්‍යාපෘතියේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ජාත්‍යන්තර සංවර්ධන සංගමය අතර 2012 මැයි 18 දින එළඹි අංක 5037 - එල්කේ දරන මූල්‍ය ගිවිසුමේ 2 උපලේඛනයේ 2 කොටසේ බී.3 ඡේදයේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මූල්‍ය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ කටයුතු ජාතික මට්ටමින් අධ්‍යාපන අමාත්‍යාංශය මඟින්ද පළාත් මට්ටමින් පළාත් සභා මඟින්ද සිදුකිරීමට අපේක්ෂා කෙරේ. ජාතික මට්ටමින් අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් සිදු කරන කටයුතු පිළිබඳ අදහස් දැක්වීම් මෙම වාර්තාවේ ඇතුළත් වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---

ව්‍යාපෘති ඇගයීම් ලියවිල්ල අනුව, දිවයිනේ සාමාන්‍ය අධ්‍යාපන අංශය මුහුණ දෙන අභියෝග ජයගැනීමට කෙරෙන 2012 – 2016 අධ්‍යාපන ආංශික සංවර්ධන රාමුව සහ වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා මූල්‍ය සහාය සැපයීමට ව්‍යාපෘතිය ක්‍රියාත්මක කෙරේ. ව්‍යාපෘතියේ මධ්‍යම මට්ටමේ ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වන්නේ අධ්‍යාපන අමාත්‍යාංශයයි. ශ්‍රී ලංකාවේ දැනුම පදනම් කරගත් ආර්ථික හා සමාජයීය සංවර්ධනය සඳහා පදනමක් සැපයීම උදෙසා ප්‍රාථමික හා ද්වීතීය අධ්‍යාපනයට ප්‍රවේශය හා ගුණාත්මක තත්ත්වය වැඩිදියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. මූල්‍ය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 11,000 කට සමාන විගැහි මිලියන 64.1 ක් ( එජඩො මිලියන 100 ) වේ. ඉන් සියයට 70 සිට සියයට 80 දක්වා අරමුදල් පළාත් අධ්‍යාපන අධිකාරීන් සඳහා වෙන් කර තිබූ අතර ශේෂය අධ්‍යාපන අමාත්‍යාංශයට වෙන් කර ඇත. ව්‍යාපෘතිය එහි කටයුතු 2012 ඔක්තෝබර් 01 දින ආරම්භ කරන ලද අතර 2017 ජුනි 30 වන විට නිම කිරීමට නියමිතය.

## 1.3 ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාව සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාව පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාව පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4. විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාව පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාව ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාවේ දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාවේ ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ ඒකාබද්ධ මූල්‍ය

කළමනාකරණ වාර්තාව පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාවේ සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීම පිණිස අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වුයේද යන බව.

(ආ) ශ්‍රී ලංකා රජය සහ ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, මෙහෙයුම් වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණය යටතේ කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඇ) ණය යටතේ ආපසු ගැනීම් මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදු කර තිබුණේද යන බව.

(ඈ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඉ) මුදල් රෙගුලාසි 150 හා මහා භාණ්ඩාගාරයේ 2015 දෙසැම්බර් 10 දිනැති අංක 245/2015 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයට අනුකූලව ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාව පිළියෙල කර තිබුණේද යන බව.

(ඊ) තැන්පතු ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ, 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌන පූර්ණය කිරීම් මහා භාණ්ඩාගාරය විසින් පවත්වා තිබුණු පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(උ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව, සහ

(ඌ) මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වුයේද යන බව.

## 2. මූල්‍ය ප්‍රකාශන
-----------------

### 2.1 මතය
----------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මාගේ මතය වනුයේ,

(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 150 සහ 2015 දෙසැම්බර් 10 දිනැති අංක 245/2015 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූල වන පරිදි 2014 අංක 41 දරන විසර්ජන පනතේ පළමු උප ලේඛනයේ ශීර්ෂ අංක 126 දරන අධ්‍යාපන අමාත්‍යාංශයේ 2015 වර්ෂයට අදාළ විසර්ජන ගිණුම පිළියෙල කර විගණනයට ඉදිරිපත් කර ඇති බව, ඉහත ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාව මහා භාණ්ඩාගාරයේ පරිගණක මුද්‍රිත සටහන්, වාර්ෂික ඇස්තමේන්තු සහ ව්‍යාපෘතිය විසින් පවත්වා ගනු ලබන පොත් හා වාර්තා සමඟ එකඟ වන බව,

(ආ) තැන්පතු ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ, 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌන පූර්ණය කිරීම් මහා භාණ්ඩාගාරය විසින් පවත්වා තිබුණු පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව සහ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව,

(ඇ) මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඈ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඉ) මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

## 3. මූල්‍ය හා භෞතික කාර්ය සාධනය
------------------------------------

### 3.1 අරමුදල් උපයෝජනය
-----------------------

මූල්‍යායනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය සහ සමාලෝචිත වර්ෂය තුළ හා 2015 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | මධ්‍යම මට්ටම සඳහා මූල්‍ය ගිවිසුමේ මූල්‍යායනය සඳහා එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන් කිරීම | උපයෝජනය කළ අරමුදල් | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | 2015 වර්ෂය තුළ | | 2015 දෙසැම්බර් 31 දක්වා | |
| | එජඩො මිලියන | රු. මිලියන | රු. මිලියන | එජඩො මිලියන | රු. මිලියන | එජඩො මිලියන | රු. මිලියන |
| ජාසංසං | 30 | 3,300 | 1,230 | 7 | 958 | 18 | 2,482 |
| | **30** | **3,300** | **1,230** | **7** | **958** | **18** | **2,482** |

පරිචයක් ලෙස, වාර්ෂික අයවැය ඇස්තමේන්තුව මඟින් වැඩ කිරීමට අනුමත කළ ප්‍රමාණයට වඩා වැඩියෙන් ව්‍යාපෘතිය විසින් අග්‍රිම ලබා ගෙන තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, සමාලෝචිත වර්ෂයේ මුල් අර්ධ වර්ෂයේ සෑම මාසයක්ම අවසාන වන විට රේඛීය අමාත්‍යාංශ බැංකු ගිණුම්වල රු.මිලියන 23 සිට රු. මිලියන 96 දක්වා පරාසයක ශේෂයන් පැවතුණි. තවද, 2015 ජූලි සිට සැප්තැම්බර් දක්වා කාල පරිච්ඡේදයේ සෑම මාසයක්ම අවසාන වන විට රේඛීය අමාත්‍යාංශ බැංකු ගිණුම්වල රු.මිලියන 37 සිට රු.මිලියන 53 දක්වා පරාසයක ශේෂයන්ද පැවතුණි.

**3.2 භෞතික ප්‍රගතිය**

2012- 2016 අධ්‍යාපන ආංශික සංවර්ධන රාමුව හා වැඩසටහන අනුව, තාක්ෂණික විද්‍යාගාර ඉදිකිරීම, එම විද්‍යාගාර සඳහා විද්‍යාගාර උපකරණ හා වෙනත් උපකරණ ප්‍රසම්පාදනය කිරීම හා ශිෂ්‍ය කාර්ය සාධනය වැඩිදියුණු කිරීම මඟින් උසස් පෙළ විද්‍යා විෂය ධාරාව සඳහා සිසු සහභාගීත්වය වැඩි කිරීමේ අරමුණින් ගුරුවරුන් සඳහා පුහුණුවීම් ලබා දීමට අධ්‍යාපන අමාත්‍යාංශය කටයුතු කර තිබුණු අතර එම අරමුණු සඳහා ණය අරමුදල් උපයෝජනය කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) තාක්ෂණික විද්‍යාගාර 1005 ක් ඉදිකිරීමට අමාත්‍යාංශය කටයුතු කර තිබුණු අතර 2012 -2015 කාල පරිච්ඡේදය සඳහා සිදු කළ රු.මිලියන 12.58 ක් වූ වෙන්කිරීම්වලින් රු.මිලියන 12.24 ක් 2015 දෙසැම්බර් 31 දිනට වැයකර තිබුණු බව නිරීක්ෂණය විය. 2015 දෙසැම්බර් 31 දිනට විද්‍යාගාර 989 ක ඉදිකිරීම් වැඩ නිම කර තිබුණු අතර එයින් විද්‍යාගාර 823 ක් 2016 මාර්තු 31 දිනට සිසුන්ගේ ප්‍රයෝජනය සඳහා විවෘත කර තිබුණි. ගුරුවරුන්ගේ හා අනෙකුත් පහසුකම්වල හිඟකම හේතුවෙන් විද්‍යාගාර 166 ක් 2016 මාර්තු 31 දිනට නිෂ්කාර්යව පැවති බව නිරීක්ෂණය විය. තවත් විද්‍යාගාර 07 ක වැඩ කෙරෙමින් පැවතුනු අතර විද්‍යාගාර 09 ක ඉදිකිරීම් වැඩ එදින වන විට ආරම්භ කර නොතිබුණි.

(ආ) වෙනත් විවිධාකාර පාසැල් ගොඩනැගිලි 55 ක් ඉදිකිරීමට රු. මිලියන 149.63 ක් වැය කර තිබුණු අතර 2015 නොවැම්බර් 30 දින වන විට අවසන් කිරීමට සැලැසුම් කර තිබුණි. කෙසේ වෙතත් අදාළ ගොඩනැගිලිවල ඉදිකිරීම් වැඩ 2016 මාර්තු 31 දින වන විට අවසන් කර නොතිබුණි. ක්‍රියාකාරී සැලැස්ම අනුව, 2016 මාර්තු 31 දින වන විට ඉන් නිම කිරීමට අපේක්ෂිත ගුරු නිල නිවාස 15 ක ඉදිකිරීම් වැඩ 2016 අප්‍රේල් 30 දින වන විටත් ආරම්භකර හෝ නොතිබුණි. තවද,

ජාතික පාසැල් 18 ක සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීමට රු.මිලියන 26.73 ක් වැය කර තිබුණු අතර 2015 නොවැම්බර් 30 දින වන විට අවසන් කිරීමට අපේක්ෂිත විය. කෙසේ වෙතත් 2016 අප්‍රේල් 30 දින වන විටත් එම වැඩ අවසන් කර නොතිබුණි.

(ඈ) කොළඹ හා කළුතර දිස්ත්‍රික්කවල විද්‍යාගාර 77 න් මහින්දෝදය විද්‍යාගාර සඳහා ගොඩනැගිලි 06 ක් ඉදිකිරීම සම්බන්ධයෙන් සිදු කරන ලද නියැදි පරීක්ෂණයේදී පොළව ප්‍රදේශයේ හා බිත්තිවල ඉරිතැලීම් ආදී ගුණත්වයේ අඩුපාඩු කිහිපයක් අනාවරණය වී තිබුණි. තවද, කළුතර දිස්ත්‍රික්කයේ වෑතර මහ විද්‍යාලයේ ඉදිකළ මහින්දෝදය විද්‍යාගාර, ගොඩනැගිල්ලේ ඉදිකිරීම් වැඩ හා පරිගණක ඇතුළු උපකරණ සවිකිරීම් 2014 දෙසැම්බර් 31 දිනට අවසන් කර තිබුණද 2016 මාර්තු දක්වා වසා දමා තිබුණි.

(ඇ) ඉදිරිපත් කළ තොරතුරු අනුව, ජාතික පාසැල් 143 ක් ඇතුළු පාසැල් 353 ක් 2015 දෙසැම්බර් 31 දිනට අ.පො.ස (උසස් පෙළ) සඳහා තාක්ෂණික විෂය ධාරාව වෙනුවෙන් පන්ති ආරම්භ කර තිබුණු අතර සිසුන් 40,589 ක් තාක්ෂණික විෂය ධාරාවෙහි විෂයයන් තෝරාගෙන තිබුණි. තවද, තාක්ෂණික විෂය ධාරා පන්ති සඳහා එක් එක් වර්ගයන්හි සුදුසුකම්ලත් ගුරුවරු 334 දෙනෙකු පමණක් සිටි බව නිරීක්ෂණය විය.

(ඉ) විභාග දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව අනුව, 2015 වර්ෂයේ දී පැවති අ.පො.ස. (උසස් පෙළ) විභාගය සඳහා පෙනී සිටි පාසැල් අයදුම්කරුවන් 210,340 ක් අතුරින් සියයට 8.64 ක් වන පාසැල් අයදුම්කරුවන් 18,183 ක් සියලු විෂය ධාරාවල සෑම විෂයයක්ම අසමත් වී තිබූ අතර සියයට 2.83 ක් වන පාසැල් අයදුම්කරුවන් 5,930 ක් විසින් සෑම විෂයයක් සඳහාම "ඒ" සමාර්ථ ලබා ගෙන තිබුණි. තවද, විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලැබීමේ ඉහළ ප්‍රතිශතයක් වාර්තා කර තිබුණේ වාණිජ්‍ය විෂය ධාරාවෙන් අධ්‍යයන කටයුතු කළ සියයට 70.38 ක් වූ පාසැල් අයදුම්කරුවන් වූ අතර, භෞතික විද්‍යා විෂය ධාරාවේ හා ජීව විද්‍යා විෂය ධාරාවේ අයදුම්කරුවන්ගෙන් පිළිවෙලින් සියයට 51.65 ක් හා සියයට 48.03 ක් විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලබා ගෙන තිබුණි. ශ්‍රී ලංකාවේ පළමු වරට 2015 වර්ෂයේ දී පැවති අ.පො.ස. (උසස් පෙළ) සඳහා පෙනී සිටි ඉංජිනේරු තාක්ෂණ විෂය ධාරාවෙන් හා ජීව විද්‍යා තාක්ෂණ විෂය ධාරාවෙන් අධ්‍යයන කටයුතු කළ පාසැල් අයදුම්කරුවන් පිළිවෙලින් සියයට 50.09 ක හා සියයට 60.66 ක සාමාර්ථ අනුපාතයන් වාර්තා කර තිබුණු අතර අයදුම්කරුවන් 11 දෙනෙක් පමණක් සෑම විෂයයක් සඳහාම "ඒ" සාමාර්ථයන් ලබා ගෙන තිබුණි. ව්‍යාපෘති ඇගයීම් වාර්තාව අනුව, වාණිජ්‍ය හා කලා විෂය ධාරාවලට වඩා විද්‍යා හා තාක්ෂණික විෂය ධාරාවලින් අ.පො.ස. (උසස් පෙළ) විභාග සඳහා පෙනී සිටි අයදුම්කරුවන්ගේ විශ්ව විද්‍යාල ප්‍රවේශ අනුපාත ඉහළ නැංවීම අපේක්ෂා කර තිබුණි.

(ඊ) පසුගිය වසර 03 තුළ 5 ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගයේ සාමාර්ථ අනුපාතය අඛණ්ඩව අඩු වී ඇති බව නිරීක්ෂණය විය. එම නිසා 2013 දී සියයට 10.12 ක සාමාර්ථ අනුපාතය 2015 වර්ෂයේ දී සියයට 09.55 ක් දක්වා අඩු වී තිබුණි.

(උ) දකුණු, මධ්‍යම හා බස්නාහිර පළාත්වල ජාතික පාසැල්වල සිදු කළ විස්තරාත්මක විගණනයේදී, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ උල්ලංඝනය කිරීම්, තහවුරු කිරීමේ ලියකියවිලි නොමැති ගෙවීම්, නිසි අධිකාරි බලය හා නිවැරදිව සකස් කළ වවුචර නොමැතිව ගෙවීම් ආදී මූල්‍ය පාලන දුර්වලතා නිරීක්ෂණය විය. තවද, ගුරුභවතුන්ගේ නිවාඩු හා ගුණාත්මක යෙදවුම් වාර්තා නිවැරදිව පවත්වා ගැනීම, සිසුන්ගේ ශිෂ්‍යාධාර වැඩසටහන් හා ව්‍යාපෘති යටතේ රජයේ ප්‍රදාන බෙදාහැරීම් වැනි

ජාතික පාසැල්වල සාමාන්‍ය පරිපාලන කටයුතු ක්ෂේත්‍රයන්, ක්‍රියාකාරී සැලැස්ම අනුව, ක්‍රියාත්මක කර නොමැති බව එම පාසැල්වල සිදු කළ විස්තරාත්මක විගණනයේ දී නිරීක්ෂණය විය.

(ඌ) 2007 දෙසැම්බර් 13 දිනැති අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛ අංක 20/2007 මඟින් පාසැල් ගුරුවරුන් සඳහා ස්ථාන මාරු ප්‍රතිපත්තිය ප්‍රකාශයට පත් කර තිබුණද ජාතික පාසැල්වල ගුරුවරුන්ගේ වාර්ෂික ස්ථාන මාරු සිදු කර නොතිබුණි. තවද, 10/2377/436/052 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව, වර්ෂ 08 කට වරක් පාසැල් ගුරුවරුන් ස්ථාන මාරු කිරීම අවශ්‍ය වේ. ඉදිරිපත් කළ තොරතුරු අනුව, 2015 දෙසැම්බර් 31 දිනට ස්ථාන මාරු කිරීමට නියමිත ජාතික පාසැල් 350 ක පාසැල් ගුරුවරුන්ගෙන් සියයට 75 ක් වර්ෂ 08 කට වඩා එකම පාසලේ රැදී තිබුණි.

## 3.3 මතභේදයට තුඩු දෙන කරුණු

ප්‍රසම්පාදන පරිපාටි අනුගමනය කිරීමකින් තොරව පුද්ගලික සමාගමකට අයිති ස්ථානයක් තෝරාගෙන රේඛීය අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් 185 කට පුහුණු වැඩමුළුවක් සූදානම් කිරීමට අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් තීරණය කර තිබුණු අතර ඒ වෙනුවෙන් රු. මිලියන 2.05 ක් වැය කර තිබුණි. කෙසේ වෙතත් මෙම පුහුණු වැඩමුළුව සඳහා නිලධාරීන් 150 ක් පමණක් සහභාගී වී ඇත. වැඩමුළුව පැවැත්වීමේ අරමුණ විගණනය වෙත පැහැදිලි කර නොතිබුණි. තවද, පුහුණු වැඩමුළුවේ ප්‍රතිලාභ ගණනය කිරීමට විධිමත් යාන්ත්‍රණයක් සකස් කර නොතිබුණි.